# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1832/21 - 2013 ඔක්තෝබර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### උතුරු පළාතේ පළාත් සභාව

අවලංගු කිරීමයි

උතුරු පළාතේ ආණ්ඩුකාරවර වන මවිසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154ඊ(1), (4) හා (5) වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කරන ලද පත්කිරීම් ඇතුළත් 2013.10.15 වැනි දිනැති අංක 1832/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මින් අවලංගු කරමි.

ජී. ඒ. චන්ද්‍රසිරි,
ආණ්ඩුකාරවර,
උතුරු පළාත.

---

### උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

උතුරු පළාත් ආණ්ඩුකාරවර ගම්මන්පිල ආරච්චිගේ චන්ද්‍රසිරි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154ඊ(1), (4) සහ (5) වැනි වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත සඳහන් පත් කිරීම් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

| | |
|---|---|
| ගරු කනගසභාපති විශ්වලිංගම් විග්නේශ්වරන් මැතිතුමා | උතුරු පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, මාර්ග සංවර්ධන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන, සමුපකාර සංවර්ධන, සමාජ සේවා හා පුනරුත්ථාපන, කාන්තා කටයුතු, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන, සංචාරක, පළාත් පාලන හා පළාත් පරිපාලනය සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍යවරයා වශයෙන් 2013ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින සිට |
| ගරු පොන්නුත්තුරෙ අයිංගරනේසන් මැතිතුමා | උතුරු පළාත් කෘෂිකර්ම හා ගොවිජන සේවා, සත්ව පාලන, වාරිමාර්ග සහ පරිසර අමාත්‍යවරයා වශයෙන් 2013ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින සිට |
| ගරු තම්බිරාසා කුරුකුලරාසා මැතිතුමා | උතුරු පළාත් අධ්‍යාපන, සංස්කෘතික කටයුතු, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යවරයා වශයෙන් 2013ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින සිට |


1A - PG 001798 — 200 (2013/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | |
|---|---|
| ගරු පත්මනාදන් සත්‍යලිංගම් මැතිතුමා | උතුරු පළාත් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා වශයෙන් 2013ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින සිට |
| ගරු බාලසුබ්‍රමනියම් ඩෙනිස්වරන් මැතිතුමා | උතුරු පළාත් ධීවර, ප්‍රවාහන, වෙළෙඳ හා වාණිජ්‍ය සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් 2013ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින සිට |

ජී. ඒ. චන්ද්‍රසිරි,
ආණ්ඩුකාරවර,
උතුරු පළාත.

11-147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.